1981 වසරේ දී වියලි මිරිස් මිළෙහි දක්නට ලැබුන පහත බැසීමේ ප්‍රවනතාවයේ ආපසු ගමන් කිරීමක් දිස්විය. වියලි මිරිස් සඳහා සාමාන්‍ය සිල්ලර මිළ 1982 වසරේ දී කිලෝග්‍රෑමයක් රු. 30.00 දක්වා සියයට 7.5 කින් ඉහළ ගියේ ය. කුළු බඩු වල සිල්ලර මිළ ද සැළකිය යුතු අන්දමින් ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන් කුළුබඩු සඳහා පැවතුන ඉහළ අපනයන මිළ හේතු කොට ගෙන ඒ සඳහා වූ සාමාන්‍ය සිල්ලර මිළ කිලෝග්‍රෑමයක් රු. 56.91 දක්වා සියයට 18 කින් වැඩි විය.

1982 වසරේ දී රෙදිපිළි සහ පාවහන් මිළ වැඩිවූයේ සියයට 5 කින් පමණි. ප්‍රධාන වශයෙන් ගඩොල්, කළුගල්, හා වැලි මගින් නියෝජනය වන ගොඩනැගිලි උපකරණ මිළ සියයට 16 කින් ඉහළ ගියේය.

## වැටුප්

ආර්ථිකයේ සංවිධානය වූ අංශයේ මුල්‍ය වැටුප් මැණීම රජයේ සේවකයන්ගේ හා වේතන මණ්ඩල වලින් ආවරණය වන සේවකයන්ගේ අවම වැටුප් ප්‍රමාණ දර්ශක මගින් කරනු ලැබේ.

රජයේ සේවකයන්ගේ මෙන්ම වේතන මණ්ඩල වලින් ආවරණය වන පෞද්ගලික අංශයේ සේවකයන්ගේද මුල්‍ය වැටුප් හා මූර්ත වැටුප් 1982 වසරේ දී වැඩි විය. එසේ වුවද, රජයේ සේවකයිනට වාසිදයක වූ වැටුප් ඒකාබද්ධ කිරීම හේතුවෙන් රාජ්‍ය අංශයේ වැටුප් වැඩි වීම පෞද්ගලික අංශයේ වැටුප් වැඩි වීමට වඩා ඉහළ මට්ටමක පැවතීමට හේතු විය.

රාජ්‍ය අංශයේ සේවකයන්ගේ මුල්‍ය වැටුප් 1981 වසරට (සියයට 15) වඩා 1982 වසරේදී (සියයට 32) ඉහළ අනුපාතිකයකින් වැඩි විය. කාර්මික හා ලිපිකාර සේවකයින්ගේ මුල්‍ය වැටුප් අනුපාත දර්ශකය 1981 වසරේදී වැඩි වූ සියයට 13 හා සසඳන විට 1982 වසරේදී සියයට 31 කින් ඉහළ ගොස් ඇත. සුළු සේවකයින් හා පාසැල් ගුරුවරුන් සම්බන්ධයෙන් 1982 මුල්‍ය වැටුප්වල අදළ වැඩි වීම සියයට 32 ක් හා සියයට 27 ක් විය. 1981 වසරේ දී අනුරූප වැඩි වීම මීට වඩා බොහෝසෙයින් අඩු වූ අතර එය පිළිවෙලින් සියයට 16 ක් හා සියයට 12 ක් විය.

1981 වසරේදී රාජ්‍ය සේවකයන්ගේ මූර්ත වැටුප්වල වූ සියයට 3 ක අවරෝහනයට ප්‍රතිවිරුද්ධ වශයෙන් 1982 වසරේදී රාජ්‍ය සේවකයන්ගේ මූර්ත වැටුප් සැළකිය යුතු අන්දමින් සියයට 19 කින් වැඩි විය, කාර්මික හා ලිපිකරු සේවකයින්ගේ මූර්ත වැටුප් 1981 වසරේ දී පෙන් වූ සියයට 5 ක පහත වැටීම හා සසඳන විට 1982 වසරේදී සියයට 18 කින් ඉහළ ගොස් ඇත. 1981 වර්ෂයේදී සුළු සේවකයන්ගේ මූර්ත වැටුප්වල වූ සියයට 2 ක පහත වැටීමට ප්‍රතිවිරුද්ධ වශයෙන් 1982 වසරේදී සියයට 19 කින් ඉහළ යන ලද අතර, පාසැල් ගුරුවරුන්ගේ මූර්ත වැටුප් 1981 දී සියයට 6 ක පහත වැටීම හා සසඳන විට 1982 වසරේදී සියයට 14 කින් වැඩි වී ඇත.

1982 වසරේදී ඇති වූ මුල්‍ය සහ මූර්ත වැටුප් වැඩි වීම පසුගිය වසර පහ තුළ වාර්තාගතව ඇති ඉහළම වැටුප් වැඩි වීමයි. 1982 ජනවාරි මස සිදු කරන ලද වැටුප් ප්‍රතිශෝධනය සහ ජීවන වියදම් දර්ශකය හා බැඳුනු ජීවන වියදම් දීමනාව නොකඩවා ගෙවීම මෙම වැටුප් ඉහළ යාමට ප්‍රධාන වශයෙන් හේතු විය. ජීවන වියදම් දර්ශකයට මේ ආකාරයෙන් වැටුප් අනුබද්ධ කිරීමෙන් නාමික වැටුප් වැඩි වීම මගින් මූර්ත වැටුප් වැඩි වීමක්ද සිදු වන බවට සහතික විය.

1981 වර්ෂයේ සංවිධානය වූ පෞද්ගලික අංශයේ තේ, රබර් හා පොල් වගාවන්හි සේවකයන්ගේ අවම වැටුප් සම්බන්ධයෙන් වූ සියයට 0·2 ක ආන්තික අඩුවීම හා සැසඳීමේ දී 1982 දී අවම වැටුප් සියයට 13 කින් වැඩි වී ඇත. කර්මාන්තවල හා වාණිජ කටයුතුවල යෙදී සිටින සේවකයන්ගේ අවම වැටුප් 1981 වසරේදී සියයට 13 කින් වැඩි වූ අතර 1982 වසරේ දී සියයට 12 කින් වැඩි වූ බව පෙන්වයි. 1981 දී සියයට 1 ක ආන්තික වැඩිවීමක් පෙන් වූ සංවිධානය වූ කෘෂිකාර්මික, කාර්මික හා වාණිජ අංශයන්හි ඒකාබද්ධ අවම වැටුප් පරිමාන දර්ශකය 1982 වසරේදී සියයට 13 කින් වැඩිවිය.

# වැටුප් ප්‍රමාණ දර්ශක අංක

1952=100

මාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

1981 දී සියයට 16 කින් පහත වැටුන කෘෂිකර්මයේ යේදී සිටි සේවකයන්ගේ මූර්ත වැටුප් 1982 දී සියයට 2 කින් වැඩි වූ අතර 1981 දී සියයට 5 ක අඩුවීමක් වාර්තා කල කාර්මික හා වාණිජ අංශවල සේවකයන්ගේ මූර්ත වැටුප් පරිමාන 1982 දී සියයට 1·5 කින් වැඩි විය.

මහ බැංකුවේ දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ ක්‍රමය මගින් රැස් කරනු ලබන තොරතුරු අනුව සංවිධානය නොවූ අංශයේ වැටුප්වල සැළකිය යුතු වැඩිවීම් දක්නට ලැබේ. 1981 හා 1982 වර්ෂ සඳහා සංවිධානය නොවූ අංශයේ දෛනික සාමාන්‍ය වැටුප් 1·32 සංඛ්‍යා සටහනින් දක්වේ.

1 · 32 සටහන

සංවිධානය නොවූ අංශයේ සාමාන්‍ය දෛනික වැටුප් ප්‍රමාණයන්

| අංශය | සේවකයා | 1981 රු. | 1982 රු. | වෙනස රු. | වෙනස ප්‍රතිශතය-කින් |
|---|---|---|---|---|---|
| වී .. | පිරිමි | 27·78 | 30·66 | 2·88 | 10 |
| | ගැහැණු | 19·82 | 22·26 | 2·44 | 12 |
| පොල් .. | පිරිමි | 27·01 | 32·29 | 5·38 | 20 |
| | ගැහැණු | 16 07 | 18·26 | 2·19 | 14 |
| රබර් .. | පිරිමි | 25·39 | 26·22 | 0 88 | 3 |
| | ගැහැණු | 18·20 | 18·88 | 0·68 | 4 |
| තේ .. | පිරිමි | 20·50 | 22·17 | 1·67 | 9 |
| | ගැහැණු | 15·17 | 15·86 | 0·69 | 5 |
| වඩු කාර්මික .. | පිරිමි | 46·85 | 53·86 | 7·01 | 15 |
| පෙදරේරු .. | පිරිමි | 45·90 | 52·44 | 6·54 | 14 |

මූලය: දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙල, ශ්‍රී ලංකා මහ බැංකුව.

සංවිධානය නොවූ අංශයේ තේ, රබර්, පොල් හා වී සහ ගොඩනැගිලි ඉදිකිරීම යන අංශවල පිරිමි හා ගැහැණු සේවකයන් සඳහා වූ දිවයිනේ දෛනික වැටුප් පරිමාණ 1982 වසරේදී ඉහළ ගොස් ඇත. පසුගිය වර්ෂය හා සසඳා බැලීමේදී 1982 වසරේදී වී වගා අංශයේ පිරිමි සේවකයන්ගේ සාමාන්‍ය දෛනික වැටුප් පරිමාණයන් සියයට 10 කින් ඉහළ ගිය අතර ගැහැණු සේවකයන්ගේ වැටුප් පරිමාණයන් සියයට 12 කින් ඉහළ ගොස් ඇති බව පෙනී යයි. මෙය 1979 වසරේ සිට වී වගා අංශයේ දක්නට ලැබුන වැටුප් පරිමාණයන් ඉහළ යාමේ නැමියාව තවදුරටත් පැවැති බව පෙන්වන්නකි. තේ, රබර් සහ පොල් වගා අංශයන්හිද පිරිමි සේවකයන්ගේ දෛනික වැටුප් ඉහළ ගොස් ඇත. පොල් වගා අංශයේ සේවකයන් සම්බන්ධයෙන් මෙම වැටුප් වැඩිවීම වඩාත්ම කැපී පෙනුන අතර අවම වැටුප් වැඩිවීම රබර් වගා අංශයේ දිස් විය. පසුගිය වර්ෂය හා සැසඳීමේදී 1982 වර්ෂයේ වඩු කාර්මිකයන්ගේ හා පෙදරේරුවන්ගේ දිවයිනේ සාමාන්‍ය වැටුප් පරිමාණයන් පිළිවෙලින් සියයට 15 කින් හා සියයට 14 කින් ඉහළ ගොස් ඇති බව පෙන්වයි.

## වෙළෙඳාම

සංවර්ධිත රටවල දිගටම පැවතුන ආර්ථික පසුබැම මෙරට අපනයනයන් කෙරෙහි කැපී පෙනෙන ලෙස බලපෑවේය. විගැහි වටිනාකම අනුව 1981 වසරේ පැවැති අපනයන වර්ධන අනුපාතිකය වූ සියයට 13 සමග සැසඳීමේ දී 1982 වසරේ දී එය සියයට 0.6 ක් පමණක් විය. අනෙක් අතට ආනයන වර්ධන අනුපාතිකය 1981 වසරේ පැවැති සියයට 2 ක මට්ටමේ සිට 1982 වසරේ දී සියයට 13 දක්වා සීඝ්‍ර වැඩිවීමක් වාර්තා කරන ලදී. 1982 වසරේ ආනයන වර්ධන අනුපාතිකය ඉහළ මට්ටමක පැවතීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ වසර තුළ නැව් (විගැහි දශ ලක්ෂ 44) සහ ගුවන් යානා (විගැහි දශ ලක්ෂ 107) මිළදී ගැනීම් වූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් ආයෝජන භාණ්ඩ ආනයනයන්හි අසාමාන්‍ය වර්ධනයක් පෙන්නුම් කරන ලදී. එමනිසා 1982 වසරේ ආනයන වර්ධන අනුපාතිකය සළකා බැලීමේ දී මෙම කරුණ ද සැළකිල්ලට ගත යුතුව ඇත.